නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!

# ධම්මපදය

## චිත්ත වර්ගය (09 ගාථාව)

**9. ගාථාව**

**අචිරං වත'යං කායෝ - පඨවිං අධිසෙස්සති**
**ඡුද්ධො අපේතවිඤ්ඤාණෝ - නිරත්ථං'ව කලිඞ්ගරං**

**පදගතාර්ථය**

| | |
|---|---|
| **අයං කායො** | - මේ ශරීරය |
| **වත** | - ඒකාන්තයෙන් |
| **අචිරං** | - නොබෝ කලකින් |
| **අපේතවිඤ්ඤාණෝ** | - පහ වූ සිත් ඇත්තේ |
| **ඡුද්ධෝ** | - බැහැර ලන ලද්දේ |
| **නිරත්ථං** | - ප්‍රයෝජන නැති |
| **කලිඞ්ගරං ඉව** | - දිරා ගිය දඬු කඩක් මෙන් |
| **පඨවිං අධිසෙස්සති** | - පොළොව මත්තෙහි හෝනේ ය. |

**භාවාර්ථය**

වැඩකට නැති දරකඩක් මෙන් මේ කය ද ඉවත ලූයේ පහ ව ගිය සිත් ඇත්තේ නොබෝ කලකින් පොළොවෙහි වැතිර සිටින්නේ ය.

**නිදන කථාව**

සැවැත් නුවරවැසි එක් කුලපුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා පැවිදි ව ලැබූ උපසම්පද ඇත්තේ, 'තිස්ස' යයි ප්‍රසිද්ධ විය. මඳ කලක් ගිය පසු ඒ ස්වාමීන් වහන්සේගේ සිරුරෙහි රෝගයක් හටගත්තේ ය. පළමු ව සිරුරෙහි අබ ඇට තරම් බිබිලි නැංගේ ය. ඒ බිබිලි පිළිවෙළින් මුං ඇට තරම් ව ද කඩල තරම් ව ද නෙල්ලි තරම් ව ද බෙලිගැට තරම් ව ද මහත් ව ගොස් අවසානයෙහි දී පැළී ගියේ ය. සිරුර සිදුරු වලින් පිරී, පසු ව ඇට ද බිඳුනි. පිළිදැගුම් නො කොට හැකි බවට පත් විය.

හඳනා පොරෝනා සිවුරු ද ලේ-සැරවෙන් තෙමී ගියේ ය. ශිෂ්‍යයෝ ද පිළිදැගුම් කරන්නට බැරි ව උන්වහන්සේ ව අත්හළහ. මෙසේ සිරුර කුණු වී ගිය බැවින් පූතිගත්ත-තිස්ස ස්ථවිර කියා පසු ව ප්‍රසිද්ධ වී ගියේ ය.

බුදුවරයෝ වනාහි දවසට දෙවරක් ලෝකය දෙස බලා වදරති. ඒ වනාහි බුදුවරුන් විසින් අත් නො හරින ලද ධර්මතාවකි. උදෑසන ලෝකය බලා වදරන විට සක්වල මුවවිට පටන් ගන්ධකුටි අභිමුඛයට නුවණ පතුරුවා බලන සේක. සවස ලොව දෙස බලන විට ගඳකිළිය පටන් සක්වල මුවවිට දක්වා නුවණ පතුරුවා බලන සේක. මේ ධර්මතාව අනු ව ලොව බලා වදරන අපගේ ස්වාමිදරු වූ බුදුරජාණන් වහන්සේගේ නුවණට තිස්ස ස්ථවිරයන් වහන්සේ පෙනී ගියහ.

එවිට බුදුරජාණන් වහන්සේ, තිස්ස තෙරුන් තුළ රහත් වීමට තිබූ හැකියාව දැක 'මේ භික්ෂුව ශිෂ්‍යයන් විසින් ද අත් හැර දමන ලද්දේ ය; දැන් මා විනා අන් පිහිටක් මොහුට නැත' යි ගඳකිළියෙන් නික්ම විහාරචාරිකාවෙහි වඩිනා සේක් ගිනිහල්ගෙට වැඩ සැළියක් ගෙන සෝද එහි වතුර වත් කොට ලිප උඩ තබා වතුර උණු වන තුරු එතැන ම වැඩ සිටි සේක. වතුර රත් වූ බව දැන තිස්ස තෙරුන් හුන් තැනට වැඩ ඒ තෙරුන් නිදහුන් ඇඳෙහි කෙළවරක් උස්සා ගත් සේක. ඒ දුටු භික්ෂූහු "ස්වාමීනි, පසෙකට වනු මැනවි. අපි ඔසවා ගන්නෙමු" යි ඇඳ දෙකෙළවරින් ඔසවා ගෙන ගිනිහල්ගෙට ගෙන ගියහ.

ඉනික්බිති බුදුරජාණන් වහන්සේ දිය-ඔරුවක් ගෙන්වා උණු දිය එහි වත් කොට භික්ෂූන් ලවා තිස්ස තෙරුන් පොරවා සිටි සිවුරු ගෙන්වා උණු දියෙහි ලා පොඩිකරවා සෝදවා මඳ අව්වෙහි ලා වියළවූ සේක. නැවත ඒ තෙරුන් ළඟ ම වැඩ සිට උණු දිය ඇඟ වත්කරමින් ඇඟ උලා නැහැවූ සේක.

ඒ අවසානයෙහි අවුවෙහි ලූ සිවුරු ද වේයළී තිබුණෙන් ඒවා ගෙන්වා හන්දවා-පොරවා එතෙක් හැඳි සිවුරු ගෙන සෝදවා ඒවා ද අව්වෙහි දමවා ලූ සේක. ඇඟෙහි වතුර වියළී යන විට ඒවා ද වියළිණි.

ඉක්බිති තිස්ස ස්ථවිර තෙමේ එක සිවුරක් හැඳ එකක් පොරවා ගෙන සැහැල්ලු සිරුරු ඇති ව එකඟ වූ සිතින් ඇඳෙහි සයනය කළේ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ තිස්ස තෙරුන්ගේ හිස දෙසින් වැඩ සිට 'මහණ, නුඹගේ මෙම සිරුර පහ වූ සිත් ඇත්තේ උපකාර නැති ව දඬුවක් සේ පොළොවෙහි හෝනේ ය' යි වදරා මේ ධර්මදේශනාව වදළ සේක.

**'අචිරං වත'යං කායෝ'** යනාදීන් වදළ ධර්මදේශනාව අවසානයෙහි පූතිගත්ත-තිස්ස ස්ථවිරයන් වහන්සේ පිළිසිඹියාවන් ලබා රහත් වූහ. අනිකුත් බොහෝ-දෙනා ද සෝවාන් ඵලාදියට පැමිණියහ.

සාධු **!** සාධු **!!** සාධු **!!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(වප් 2551)**

**<u>සම්පාදක:</u>** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**<u>පිටු සැකසීම:</u>** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**<u>ධර්මදානය:</u>** පින්වත් දයාසීලී උපාසිකා මාතාව හා උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දයන් වහන්සේගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* www.sadaham.net *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**